# අපි දෙන්නා යාළු



නෙතුමි සවිත්මා සෙනරත් බණ්ඩාර

# අපි දෙන්නා යාළු

කතාව හා චිත්‍ර

නෙතුමි සවිත්මා සෙනරත් බණ්ඩාර

ISBN 978-624-208-136-6

4 ශ්‍රේණිය

# පිදුම

මාගේ ප්‍රථම පිදුම ලෙස පිලිගන්වන මෙම කථාව සකස් කිරීමට සහය දැක් වු මගේ අම්මා, අප්පච්චිට, අක්කාට හා අයියාටත් මේ සදහා උපදෙස් ලබා දුන් මාගේ විදුහලේ ගුරු මැණිවරුන්ටත් නන් අයුරින් උපදෙස් ලබා දුන් සියලුම දෙනාට මෙමපොත පිලි ගන්වමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි. එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි.2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතිය මෙමගින් පිරිනමමි.මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි.

# අපි දෙන්නා යාළු

එකමත් එක ගමක චූටි ළමයි දෙන්නෙක් හිටියා. ඒ තමයි සඳුනියි, වරුනියි. ඒ දෙන්නා කවදාවත්ම තරහ වුනේ නෑ.හැමදාම හැමදේම බෙදාහදා ගෙන තමයි ජීවත් වුණේ.



ඒ දෙන්නා හිටියේ දොළුවේ, එයාලගේ අම්මලාගේ මහගෙදර. එහෙ ඉතාමත් ලස්සනයි. පුංචි කන්දක් උඩ ලොකු මිදුලක් තිබුණු නිසා මේ දෙන්නා හොඳට සෙල්ලම් කළා.



අත්තම්මත් එක්ක අත් වැඩ කළා.
කතන්දර ඇහුවා. ඔංචිලි පැද්දා.
හරිම සතුටින් තමයි ජීවත් උනේ.



ඔහොම ටික දිනක් යනකොට අනේ ඒ අත්තම්මා අසනීප වෙලා නැතිඋනා. මේ දෙන්නට හරිම දුකයි. ඒ දෙන්නා හොඳටම ඇඬුවා.



අත්තම්මා නැති නිසා වරුනිගේ මල්ලි බලාගන්න කෙනෙකුත් නැති නිසා වරුනිගේ අම්මා වරුනිත් , මල්ලිවත් අරගෙන නුවර ගෙදරක පදිංචියට ගියා. සඳුනිට කියාගන්න බැරි තරම් දුකක් ඇතිඋනා.



හැම නිවාඩුවකම සඳුනි එයි කියලා බලාගෙන හිටියත් වරුනිගේ අම්මාට නිවාඩු නැති නිසා ඒ දවස උදාඋනේ නෑ. ඉතින් සඳුනිට සිද්ධ වුනේ හැමදාම තනියම සෙල්ලම් කරන්න.



සෙල්ලම් කරන හැමවෙලාවෙම සඳුනිට හිතුනේ "එයා මාව බලන්න කොයි මොහොතක හරි එයි කියලා". හොඳට ඉර පායපු ලස්සන දවසක් ආවා. සඳුනිගේ සෙල්ලම් ගෙදර ලඟටම ඇවිත් නවත්තපු ත්‍රීරෝද රථයෙන් සිනාමුසු මුහුණින් බැස්ස වරුනි දැක්ක සඳුනිගේ සතුට නිම් හිම් නැතිඋනා.



අද නම් අපි හොඳට සෙල්ලම් කරනවා සඳුනි සතුටින් උඩපැන්නා." එයා එක විනාඩියකට හරි මාව බලන්න එනවා කියලා මගේ හිත හැමදාම කිව්වා."
සඳුනිගේ හිතේ තිබුණු විශ්වාසය ගැන සඳුනිට හරි ආඩම්බර හිතුනා. පුංචි හිත්වල සතුට උතුරා යනකල් දෙන්නම සෙල්ලම් කරා.



තමන්ගේ ආදරණීය
බලාපොරොත්තු ගැන ඔයාලත්
කවදාවත් අවිශ්වාස කරන්න එපා.
ඒවා කවදා හෝ ඉටුවෙනවා.
එතෙක් උත්සාහයෙන් සහ
විශ්වාසයෙන් සතුටින් ඉන්න
ඔයාලත් පුරුදු වෙන්න.



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමඟ සිදුවන සමාජ ආර්ථික පරිවර්ථනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩාම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්ථාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය ඒ තුළින් සම්පාදන වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මඟපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු .

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023.10.20